# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2469/12 - 2025 දෙසැම්බර් මස 31 වැනි බදාදා - 2025.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි සහ 5 වැනි වගන්තිය යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, 2025 දෙසැම්බර් මස 31 දිනයෙන් පැවති බදු අනුප්‍රමාණයන්ගේ වලංගු කාලය අවසන්වීම මත, මෙහි පහත උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් මෙම නියමය මගින් පනවමි.

**උපලේඛනය**

| *I වන තීරය* | | | | *II වන තීරය* |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතය* | *විස්තරය* | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| 1 | 03.02 | | 03.04 ශීර්ෂයේ කටු ගැල වූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, අළුත් හෝ ශීතකළ මසුන් | 10% හෝ කි. ග්‍රෑමයට රු. 400/- යන දෙකෙන් ඉහළ අගයක් වන බදු ප්‍රමාණය |
| | 03.03 | | 03.04 ශීර්ෂයේ කටු ගැල වූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායිත මසුන් | 10% හෝ කි. ග්‍රෑමයට රු. 400/- යන දෙකෙන් ඉහළ අගයක් වන බදු ප්‍රමාණය |
| 2 | 03.05 | 0305.54.10 | හාල් මැස්සන් | කි. ග්‍රෑමයට රු.100/- |




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *1 වන තීරය* | | | | *11 වන තීරය* |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතය* | *විස්තරය* | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| 3 | | 0305.52.00<br>0305.53.00<br>0305.54.90<br>0305.59.30<br>0305.59.90 | කරවල | කි.ග්‍රෑමයට රු. 100/- |
| 4 | | 0305.59.10 | උම්බලකඩ සහ ඒ සඳහා ආදේශක | කි.ග්‍රෑමයට රු. 302/- |
| 5 | 04.03 | 0403.20 | යෝගට් | කි.ග්‍රෑමයට රු. 2000/- |
| | | 0403.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 2000/- |
| 6 | 04.05 | 0405.10 | වෙඩරු | කි.ග්‍රෑමයට රු. 1500/- |
| | | 0405.20 | කිරිවලින් නිපදවූ තැවරුම් | කි.ග්‍රෑමයට රු. 2000/- |
| | | 0405.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 2000/- |
| 7 | 04.06 | 0406.20 | සියලුම වර්ගවල පෙරන්ගාන ලද හෝ පිටි කරන ලද කේජු | කි.ග්‍රෑමයට රු. 600/- |
| 8 | 07.01 | 0701.90 | අනෙකුත් - අර්තාපල් | කි.ග්‍රෑමයට රු. 80/- |
| 9 | 07.03 | 0703.10.10 | රතු ළූනු | කි.ග්‍රෑමයට රු. 50/- |
| 10 | | 0703.10.20 | බොම්බයි ළූනු | කි.ග්‍රෑමයට රු. 50/- |
| 11 | | 0703.20 | සුදු ළූනු | කි.ග්‍රෑමයට රු. 50/- |
| 12 | 07.13 | 0713.10.10 | සම්පූර්ණ - මෑ වර්ගයේ ඇට (පිසම් සැටයිවම්) | කි.ග්‍රෑමයට රු. 5/- |
| | | 0713.10.20 | පියළි කළ - මෑ වර්ගයේ ඇට (පිසම් සැටයිවම්) | කි.ග්‍රෑමයට රු. 10/- |
| 13 | | 0713.20.10 | සම්පූර්ණ - කොණ්ඩ කඩල (ගාර්බන්සෝස්) | කි.ග්‍රෑමයට රු. 5/- |
| | | 0713.20.20 | පියළි කළ - කොණ්ඩ කඩල (ගාර්බන්සෝස්) | කි.ග්‍රෑමයට රු. 10/- |
| 14 | | 0713.31.19 | අනෙකුත් - මුං ඇට | කි.ග්‍රෑමයට රු. 300/- |
| 15 | | 0713.31.22 | උඳු : පිට කුරුට්ට ඉවත්කළ, පියළි කළ හෝ පියළි නොකළ | කි.ග්‍රෑමයට රු. 300/- |
| | | 0713.31.29 | උඳු : අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 300/- |
| 16 | | 0713.35.90 | අනෙකුත් - කව්පි | කි.ග්‍රෑමයට රු. 300/- |
| 17 | | 0713.40.11 | මයිසූර් පරිප්පු (රතු පරිප්පු) සම්පූර්ණ | කි.ග්‍රෑමයට ශත 25 |
| | | 0713.40.12 | මයිසූර් පරිප්පු (රතු පරිප්පු) පියලි කළ | කි.ග්‍රෑමයට ශත 25 |
| | | 0713.40.21 | කහ පරිප්පු - සම්පූර්ණ | කි.ග්‍රෑමයට ශත 25 |
| | | 0713.40.22 | කහ පරිප්පු - පියලි කළ | කි.ග්‍රෑමයට ශත 25 |
| 18 | 08.04 | 0804.10.10 | රට ඉඳි - අලුත් | කි.ග්‍රෑමයට රු. 200/- |
| | | 0804.10.20 | රට ඉඳි - වියළි | කි.ග්‍රෑමයට රු. 200/- |
| 19 | | 0804.50.50 | මැංගුස්ටින් - අලුත් | කි.ග්‍රෑමයට රු. 200/- |
| | | 0804.50.60 | මැංගුස්ටින් - වියළි | කි.ග්‍රෑමයට රු. 200/- |
| 20 | 08.05 | 0805.10.10 | දොඩම් - අලුත් | කි.ග්‍රෑමයට රු. 600/- |

| *1 වන තීරය* | | | | *11 වන තීරය* |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතය* | *විස්තරය* | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| 21 | | 0805.10.20 | දොඩම් - වියළි | කි.ග්‍රෑමයට රු. 125/- |
| 22 | | 0805.22.10 | ක්ලෙමන්ටයින් - අලුත් | කි.ග්‍රෑමයට රු. 120/- |
| 23 | | 0805.22.20 | ක්ලෙමන්ටයින් - වියළි | කි.ග්‍රෑමයට රු. 250/- |
| 24 | | 0805.29.20 | අනෙකුත් - වියළි | කි.ග්‍රෑමයට රු. 250/- |
| 25 | | 0805.40.10 | මහසිදරන්, පොමෙලෝස් ඇතුළුව - අලුත් | කි.ග්‍රෑමයට රු. 285/- |
| 26 | | 0805.40.20 | මහසිදරන්, පොමෙලෝස් ඇතුළුව - වියළි | කි.ග්‍රෑමයට රු. 300/- |
| 27 | | 0805.50.10 | ලෙමන් - අලුත් | කි.ග්‍රෑමයට රු. 350/- |
| 28 | | 0805.50.20 | ලෙමන් - වියළි | කි.ග්‍රෑමයට රු. 400/- |
| 29 | | 0805.90.10 | අනෙකුත් - අලුත් | කි.ග්‍රෑමයට රු. 300/- |
| 30 | | 0805.90.20 | අනෙකුත් - වියළි | කි.ග්‍රෑමයට රු. 375/- |
| 31 | 08.06 | 0806.10 | මිදි - අලුත් | කි.ග්‍රෑමයට රු. 600/- |
| 32 | | 0806.20 | මිදි - වියළි | කි.ග්‍රෑමයට රු. 600/- |
| 33 | 08.08 | 0808.10 | ඇපල් | කි.ග්‍රෑමයට රු. 600/- |
| 34 | | 0808.30 | පෙයාර්ස් | කි.ග්‍රෑමයට රු. 220/- |
| 35 | | 0808.40 | ක්වින්සස් | කි.ග්‍රෑමයට රු. 350/- |
| 36 | 08.09 | 0809.10 | ඇප්‍රිකොට් | කි.ග්‍රෑමයට රු. 350/- |
| 37 | | 0809.21 | ඇඹුල් චෙරීස් (ප්‍රූනුස් සෙරාසස්) | කි.ග්‍රෑමයට රු. 330/- |
| 38 | | 0809.29 | අනෙකුත් - චෙරීස් | කි.ග්‍රෑමයට රු. 315/- |
| 39 | | 0809.30 | නෙක්ටාරින්ස් ඇතුළු පීචස් | කි.ග්‍රෑමයට රු. 310/- |
| 40 | | 0809.40 | ප්ලම්ස් සහ ස්ලෝස් | කි.ග්‍රෑමයට රු. 250/- |
| 41 | 08.10 | 0810.50 | කිවි ෆෲට් | කි.ග්‍රෑමයට රු. 175/- |
| 42 | | 0810.90.90 | අනෙකුත් - පලතුරු | කි.ග්‍රෑමයට රු. 600/- |
| 43 | 09.04 | 0904.21.10 | මිරිස් - වියළි කුඩු නොකළ හෝ නොඇඹරූ | කි.ග්‍රෑමයට රු. 100/- |
| | | 0904.22.10 | මිරිස් - වියළි කුඩු කළ හෝ ඇඹරූ | කි.ග්‍රෑමයට රු. 125/- |
| | | 0904.22.90 | අනෙකුත් - කුඩු කළ හෝ ඇඹරූ | කි.ග්‍රෑමයට රු. 125/- |
| 44 | 09.09 | 0909.21 | කොත්තමල්ලි බීජ - කුඩු නොකළ හෝ නොඇඹරූ | කි.ග්‍රෑමයට රු. 26/- |
| | | 0909.22 | කොත්තමල්ලි බීජ - කුඩු කළ හෝ ඇඹරූ | කි.ග්‍රෑමයට රු. 52/- |
| 45 | | 0909.31 | සූදුරු බීජ - කුඩු නොකළ හෝ නොඇඹරූ | කි.ග්‍රෑමයට රු. 162/- |
| | | 0909.32 | සූදුරු බීජ - කුඩු කළ හෝ ඇඹරූ | කි.ග්‍රෑමයට රු. 162/- |
| 46 | | 0909.61.20 | මහදුරු බීජ | කි.ග්‍රෑමයට රු. 162/- |
| 47 | 09.10 | 0910.99.10 | උළුහාල් ඇට | කි.ග්‍රෑමයට රු. 50/- |
| 48 | | 0910.30.10 | කහ - කුඩු නොකළ හෝ නොඇඹරූ | කි.ග්‍රෑමයට රු. 102/- |
| | | 0910.30.90 | කහ - අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 360/- |
| 49 | 10.05 | 1005.90 | අනෙකුත් - බඩ ඉරිඟු | කි.ග්‍රෑමයට රු. 25/- |
| 50 | 10.06 | | සහල් | |

| *1 වන තීරය* | | | | *11 වන තීරය* |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතය* | *විස්තරය* | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | | 1006.20 | දහයියා ඉවත් කළ (දුඹුරු) සහල් | කි.ග්‍රෑමයට රු. 65/- |
| | | 1006.30 | පාහින ලද හෝ ඔප දමන ලද හෝ නොලද සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ සහල් | |
| | | | රළු සහල්: | |
| | | 1006.30.19 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 65/- |
| | | | මදක් තැම්බූ සහල් : | |
| | | 1006.30.29 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 65/- |
| 51 | 10.08 | 1008.21.10 | බීජ - කුරක්කන් (ඉලියුසිනේ කොරකාන විශේෂ) | කි.ග්‍රෑමයට රු. 300/- |
| | | 1008.21.90 | බීජ අනෙකුත් (මිලට්) | කි.ග්‍රෑමයට රු. 300/- |
| | | 1008.29.10 | අනෙකුත් කුරක්කන් (ඉලියුසිනේ කොරකාන විශේෂ) | කි.ග්‍රෑමයට රු. 300/- |
| | | 1008.29.90 | අනෙකුත් (මිලට්) | කි.ග්‍රෑමයට රු. 300/- |
| 52 | 11.02 | 1102.90.20 | කුරක්කන් (ඉලියුසිනේ කොරකාන විශේෂ) පිටි | කි.ග්‍රෑමයට රු. 150/- |
| 53 | 11.06 | 1106.10.10 | උඳු පිටි | කි.ග්‍රෑමයට රු. 325/- |
| 54 | 12.02 | 1202.42 | රට කජු - පොතු හරින ලද | කි.ග්‍රෑමයට රු. 220/- |
| 55 | 12.07 | 1207.50 | අබ ඇට | කි.ග්‍රෑමයට රු. 62/- |
| 56 | 15.07 | | ශුද්ධ කළ හෝ නොකළ, නමුත් රසායනිකව නවීකරණය නොකළ සෝයා බෝංචි තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස් | |
| | | 1507.10 | මැලියම් ඉවත් කළ හෝ නොකළ අශුද්ධ තෙල් | කි.ග්‍රෑමයට රු. 250/- |
| | | 1507.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 275/- |
| | 15.11 | | ශුද්ධ කළ හෝ නොකළ, නමුත් රසායනිකව නවීකරණය නොකළ පාම් තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස් | |
| | | 1511.10 | ශුද්ධ නොකළ තෙල් | කි.ග්‍රෑමයට රු. 250/- |
| | | 1511.90 | අනෙකුත්: | |
| | | 1511.90.10 | කාමර උෂ්ණත්වයේ ඇති අනුක්‍රමික (පාම් ස්ටියරින්) | කි.ග්‍රෑමයට රු. 250/- |
| | | 1511.90.20 | ලීටර් 210 හෝ ඊට අඩු ඇසුරුම්වලින් ආනයනය කළ පාම් තෙල් | කි.ග්‍රෑමයට රු. 275/- |
| | | 1511.90.30 | ශුද්ධ නොකළ පාම් ඔලෙයින් | කි.ග්‍රෑමයට රු. 255/- |
| | | 1511.90.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 275/- |
| | 15.12 | | ශුද්ධ කළ හෝ නොකළ, නමුත් රසායනිකව නවීකරණය නොකළ සූරියකාන්ත ඇටවල තෙල්, සැෆ්ෆලවර් හෝ කපු ඇට තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස් | |
| | | | සූරියකාන්ත ඇටවල තෙල් හෝ සැෆ්ෆලවර් තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස් | |

| *1 වන තීරය* | | | | *11 වන තීරය* |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතය* | *විස්තරය* | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | | 1512.11 | ශුද්ධ නොකළ තෙල් | කි.ග්‍රෑමයට රු. 250/- |
| | | 1512.19 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 275/- |
| | 15.13 | | ශුද්ධ කළ හෝ නොකළ, නමුත් රසායනිකව නවීකරණය නොකළ පොල් (කොප්පරා), පාම් ගෙඩි මද හෝ බාබසු තෙල් සහ ඒවායින් ඉතිරි වූ කොටස් | |
| | | | පොල් (කොප්පරා) තෙල් හා ඉන් ඉතිරි වූ කොටස්: | |
| | | 1513.11 | අශුද්ධ තෙල් | |
| | | | තොග වශයෙන් | |
| | | 1513.11.11 | අදූෂිත පොල් තෙල් | කි.ග්‍රෑමයට රු. 125/- |
| | | 1513.11.19 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 125/- |
| | | | අනෙකුත් | |
| | | 1513.11.21 | අදූෂිත පොල් තෙල් | කි.ග්‍රෑමයට රු. 125/- |
| | | 1513.11.29 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 125/- |
| | | 1513.19 | අනෙකුත් | |
| | | 1513.19.10 | තොග වශයෙන් | කි.ග්‍රෑමයට රු. 150/- |
| | | 1513.19.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 150/- |
| | | | පාම් ගෙඩි මද හෝ බාබසු තෙල් සහ ඒවායින් ඉතිරි වූ කොටස් | |
| | | 1513.21 | අශුද්ධ තෙල් | කි.ග්‍රෑමයට රු. 250/- |
| | | 1513.29 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 275/- |
| 57 | 15.16 | 1516.20 | ශාකමය මේද සහ තෙල් සහ ඒවායින් ඉතිරි වූ කොටස් | කි.ග්‍රෑමයට රු. 160/- |
| 58 | 15.17 | 1517.10.30 | මාගරින් - මේද ප්‍රතිශතය 80% හෝ ඊට වැඩි | කි.ග්‍රෑමයට රු. 650/- |
| | | 1517.10.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 650/- |
| 59 | | 1517.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 200/- |
| 60 | 16.04 | 1604.11 | සැමන් | කි.ග්‍රෑමයට රු. 200/- |
| | | 1604.12 | හුරුල්ලන් | කි.ග්‍රෑමයට රු. 200/- |
| | | 1604.13 | සාඩින්, සාඩිනෙල්ලා සහ බ්‍රිස්ලින් හෝ හාල්මැස්සන් | කි.ග්‍රෑමයට රු. 200/- |
| | | 1604.14 | ඇටවල්ලා, ස්කිප්ජැක් සහ බොනිටෝ (සර්ඩා විශේෂයන්) | කි.ග්‍රෑමයට රු. 200/- |
| | | 1604.15 | මැකරල් | කි.ග්‍රෑමයට රු. 200/- |
| | | 1604.16 | ඇන්චෝවීසි | කි.ග්‍රෑමයට රු. 200/- |
| | | 1604.17 | ආදන් | කි.ග්‍රෑමයට රු. 200/- |
| | | 1604.19 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 200/- |
| | | 1604.20 | අනෙකුත් සකස් කළ හෝ සුරක්ෂිත මාළු | කි.ග්‍රෑමයට රු. 200/- |

| *1 වන තීරය* | | | | *11 වන තීරය* |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතය* | *විස්තරය* | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| 61 | 17.01 | | ඝන තත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනිකව පවිත්‍ර සුක්‍රෝස් | |
| | | | අනෙකුත්: | |
| | | 1701.91 | එකතුකරන ලද රසකාරක හෝ වර්ණක අඩංගු: | |
| | | 1701.91.10 | පොලරිමීටරයේ $99.7^0$ ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත | කි.ග්‍රෑමයට රු. 50/- |
| | | 1701.91.20 | පොලරිමීටරයේ $99.5^0$ ට වැඩි හෝ සමාන සහ $99.7^0$ ට අඩු සංඛ්‍යාත සහිත | කි.ග්‍රෑමයට රු. 50/- |
| | | 1701.99 | අනෙකුත් : | |
| | | 1701.99.10 | පොලරිමීටරයේ $99.7^0$ ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත උක් සීනි | කි.ග්‍රෑමයට රු. 50/- |
| | | 1701.99.20 | පොලරිමීටරයේ $99.5^0$ ට වැඩි හෝ සමාන සහ $99.7^0$ ට අඩු සංඛ්‍යාත සහිත උක් සීනි | කි.ග්‍රෑමයට රු. 50/- |
| | | 1701.99.30 | පොලරිමීටරයේ $99.7^0$ ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත බීට් සීනි | කි.ග්‍රෑමයට රු. 50/- |
| | | 1701.99.40 | පොලරිමීටරයේ $99.5^0$ ට වැඩි හෝ සමාන සහ $99.7^0$ ට අඩු සංඛ්‍යාත සහිත බීට් සීනි | කි.ග්‍රෑමයට රු. 50/- |
| | | 1701.99.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 50/- |
| | | | | |
| 62 | 25.01 | 2501.00 | ජලීය ආකාරයේ හෝ එසේ නොවන ආකාරයෙන් වූ හෝ එකතු කරන ලද කැටි නොගැසීම් කාරකයෝ නිදහසේ පාවීම සඳහා වන ද්‍රව්‍යයන් අඩංගුවන්නා වූ, ශුද්ධ සෝඩියම් ක්ලෝරයිඩ් හෝ ලුණු (මේස ලුණු සහ ස්වභාවික තත්ත්වය වෙනස් කළ ලුණු ඇතුළුව); මුහුදු ජලය | කි.ග්‍රෑමයට රු. 40/- |

2. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඉහත උපලේඛනයේ දක්වා ඇති;

(i) "රාමසාන් උපවාස සමයේ නොමිලයේ බෙදාහැරීම සඳහා ගෙන්වනු ලබන රටඉඳි සඳහා බදු සහන ලබාගැනීම" යන මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 25/2420/822/059 සහ 2025 දෙසැම්බර් මස 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, විදේශ රාජ්‍යයන්, ව්‍යාපාරික ආයතන ඇතුළු සංවිධාන, ස්වේච්ඡා සංවිධාන හා හිතෛෂීන් විසින් පරිත්‍යාග හෝ ත්‍යාග වශයෙන් විදේශ විනිමය වැය නොවන පදනමින් සහ වානිජ පරමාර්ථ සඳහා භාවිතා නොකළ යුතු බවට ලබාදෙන, සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 0804.10.10 සහ 0804.10.20 යටතේ වන රටඉඳි ආනයනය සඳහා අදාළ වන කිලෝ ග්‍රෑමයකට රු. 200 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු. 1 ක් අයකරගෙන ඉතිරි වටිනාකම, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයට යටත්ව අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

මෙම නියමය, 2026 ජනවාරි මස 01 වැනි දින සිට 2026 මාර්තු මස 20 දින දක්වා වූ කාල සීමාවක් සඳහා 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගු පැවතිය යුතු ය.

(ii) සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 03.03 යටතේ වන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0303.54 යටතේ වර්ගීකරණය වන මැකරල් (ස්කොම්බර් ස්කොම්බ්‍රස්, ස්කොම්බර් ඕස්ට්‍රේලසිකස්. ස්කොම්බර් ජැපොනිකස්) හා සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0303.55 යටතේ වර්ගීකරණය වන ජැක් සහ හෝස් මැකරල් (ට්‍රාචුරුස් විශේෂ) ආනයනය කිරීමේ දී අදාළ වන 10% ක් හෝ කිලෝ ග්‍රෑමයකට රු. 400ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු. 6 ක් අයකරගෙන ඉතිරි වටිනාකම, දේශීය ටින්මාළු නිෂ්පාදකයන් විසින් ටින් මාළු නිෂ්පාදනය සඳහා ආනයනය කිරීමේ දී, ධීවර විෂයය භාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත, අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

(iii) සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 2501.01 යටතේ වර්ගීකරණය වන ලුණු (Sodium Chloride B.P) ආනයනය කිරීමේ දී අදාළ වන කිලෝ ග්‍රෑමයකට රු. 40 ක් වන විශේෂ වළෙඳ භාණ්ඩ බද්දෙන්, කිලෝ ග්‍රෑමයකට රු. 10ක් අයකර ගෙන ඉතිරි වටිනාකම, සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) යටතේ ලියාපදිංචි වාණිජ පරමාර්ථයෙන් තොරව ඖෂධ නිෂ්පාදනය කරන ඕනෑම ඖෂධ නිෂ්පාදන ආයතනයක් සඳහා අත්හරිනු ලැබිය යුතුය.

3. ඉහත සඳහන් කර ඇති බඩ ඉරිඟු, උඳු, මුං ඇට, කව්පි හා කුරක්කන් ආනයනය කිරීම කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ නිර්දේශය මත සිදුකළ යුතුය.

4. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඉහත සඳහන් 2 (i) නියමය හැර, 2026 ජනවාරි 01 වැනි දින සිට 2026 දෙසැම්බර් මස 31 දින දක්වා වූ කාල සීමාවක් සඳහා, මෙම නියමය වලංගුව පැවතිය යුතු ය.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

EOG 01 - 0012

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.